**ශීර්ෂය 273 - පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

**----------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**-------------------------------**

පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය**,** එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පුත්තලම දිස්ත්‍රික් ලේකම් කර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 මැයි 21 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 මැයි 21 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ යටතේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**---------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම**,** විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**---------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්**,** වියදම්**,** වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදි.

**1.5** **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන ලෙස පිළියෙල කර ඇත.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1** **මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

**(අ)** **අත්හැරීම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 267/2018 හා 2018 නොවැම්බර් 21 දරන චක්‍රලේඛනයේ 8.2 ඡේදය ප්‍රකාරව මූල්‍ය නොවන වත්කම් නිසි පරිදි හඳුනාගෙන පිරිවැය හෝ තක්සේරු අංගය ගිණුම්ගත කිරීමට කටයුතු කළයුතු වුවත්, වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් වත්කම් 12 ක වටිනාකම් ඉඩම් හා ගොඩනැඟිලි යටතේ වෙන වෙනම දැක්වීමට කටයුතු කර නොතිබූ අතර, හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වසම් 06 ක ඉදිකර තිබූ සේවා පියස හා ඒවා පිහිටි ඉඩම් එසේ ගිණුම්ගත කර නොතිබුණි. | අදාළ සේවා පියස්වල ඉඩම් ප්‍රමාණ පිළිබඳව නිශ්චිතව හඳුනා ගැනීම පිණිස පහත පරදි සේවා පියස කාර්යාල මැනුම් කිරීම සඳහා පුත්තලම මැනුම් අධිකාරී වෙත මැනුම් ඉල්ලීම් යවා ඇත. මෙම මැනුම් කටයුතු අවසන් කර මැනුම් සිතියම් මේ දක්වා ලැබී නොමැත. අදාළ පිඹුරු ලද පසු තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර නිවැරදි තක්සේරු වටිනාකම් ලබා, සීඝ්‍රාස් වැඩසටහන වෙත ඇතුළත් කිරීමට කටයුතු කරමි. | රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 267/2018 ප්‍රකාරව මූල්‍ය නොවන වත්කම් නිසි පරිදි හඳුනාගෙන පිරිවැය හෝ තක්සේරු අංකය ගිණුම්ගත කළයුතු බව. |

**(ආ)** **නොසැසඳීම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබුණු මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දේපළ පිරියත හා උපකරණ වටිනාකම රු.2,618,040,805 ක් වූ අතර, භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත | මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශයේ ඒසීඒ 6 ආකෘතියට අනුව සකසන ලද මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයත්, දේපළ පිරියත හා උපකරණ | භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන්වල දැක්වෙන දේපල පිරියත උපකරණ වටිනාකම, මූල්‍ය |

| | | |
|---|---|---|
| සටහන් අනුව හා ඒසීඒ 6 ආකෘතිය අනුව පිළියෙල කර තිබුණු මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ දේපළ, පිරියත හා උපකරණ වටිනාකම රු.2,552,542,130 ක් වූයෙන් රු.65,498,675 ක් නොසැසඳීමක් නිරීක්ෂණය විය. | ප්‍රකාශයේ වටිනාකම රු.2,618,040,805ක් බව ද දන්වමි. | නොවන වත්කම් ප්‍රකාශයේ දේපල පිරියත හා උපකරණ වටිනාකම ලෙස ගිණුම්ගත කළයුතු බව. |

### 1.6.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ගිණුම්ගත කර තිබුණු භෞතික වත්කම් ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් වටිනාකම රු.46,956,248 ක් වූ නමුත්, මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම් අත්පත් කර ගැනීම් ලෙස රු.39,862,708 ක් සටහන් කර තිබුණු අතර, රු.7,093,540 ක වෙනසක් නිරීක්ෂණය විය. | ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ගිණුම් ගත කර තිබුණු මුදල් යටතේ මූල්‍ය වත්කම් පුනරුත්තාපනය හා වැඩිදියුණු කර ගැනීම , මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම හා හැකියා වර්ධනය ඇතුළත් වේ. නමුත් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ සඳහන් රු.39,862,708 යටතේ මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම හා අනෙකුත් ආයතනවලින් ලැබුණු වත්කම් ඇතුළත් කිරීම් පමණක් ඇතුළත් වේ. | සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගත් ජංගම නොවන වත්කම් අත්පත් කර ගැනීම් වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයක් යටතේ ගිණුම්ගත කළ යුතු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | 2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | දීප ව්‍යාප්ත සේවාවල සේවය කරන නිලධාරීන් අවුරුදු 05 ක් ම එකම ස්ථානයක සේවය කර ඇත්නම් වෙනත් ස්ථානවල සේවය කිරීමට ඉඩදීම සඳහා වහාම ස්ථානමාරු කළයුතු වුවත් මහවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් 29 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. | විගණනය මඟින් පෙන්වා දී ඇති සියලුම කළමනාකරණ සේවා නිලධාරීන්, මාගේ ස්ථානමාරු නියෝග මඟින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල අතර ස්ථානමාරු කර ඇති අතර ග්‍රාම නිලධාරි වසම මට්ටමින් ද මාරු කිරීම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් සිදුකර ඇත. | දීප ව්‍යාප්ත සේවාවල සේවය කරන නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළයුතු වීම. |
| (ආ) | 2020 ජනවාරි 03 දිනැති 01/2017 (1) දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 ක ගොඩනැඟිලි පිළිබඳ තොරතුරු 2020 ජනවාරි 20 දිනට පෙර කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත ඉදිරිපත් කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත්, එම තොරතුරු ඉදිරිපත් කිරීමට අපොහොසත් වී තිබුණි. | කොවිඩ් 19 තත්ත්වය හේතුවෙන් තොරතුරු ඉදිරිපත් කිරීම ප්‍රමාද වී ඇත. අසම්පූර්ණ දත්ත නිවැරදිව සම්පූර්ණ කිරීමට කටයුතු කරන බව වැඩිදුරටත් සඳහන් කර සිටිමි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළයුතු වීම. |
| (ඇ) | 2019 දෙසැම්බර් 01 දිනැති මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ සංවර්ධන චක්‍රලේඛ අංක 01/2019 හි 08 ඡේදය | "සපිරිගමක්" ප්‍රජාපාදක ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ කල්පිටිය, ආණමඩුව, නවගත්තේගම සහ පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපෘති පිළිවෙලින් 62ක්, 97ක්, 55ක් සහ 51 ක් සම්බන්ධයෙන් ග්‍රාමීය මාර්ග පඩිපෙල, බෝක්කු, කුඩා පාලම් පැතිකාණු යන ක්ෂේත්‍රයට පමණක් ප්‍රමුඛතාවය ලබාදී ක්‍රියාත්මක කර තිබුණි. චක්‍රලේඛය මඟින් ප්‍රමුඛතාවය ලබාදී තිබුණු ක්ෂේත්‍ර 08ම ආවරණය වන පරිදි ව්‍යාපෘති තෝරාගෙන ක්‍රියාත්මක කිරීම කෙරෙහි වගකිව යුතු නිලධාරීන්ගේ අවධානය යොමු වී නොතිබුණි. | වැඩසටහන යටතේ ව්‍යාපෘති සඳහා දේශපාලන නියෝජනය මත ග්‍රාමීය කමිටුව වෙත අදාළ චක්‍රලේඛ ප්‍රකාරය දැනුවත් කර, ග්‍රාමීය මට්ටමින් යෝජනා ලබාගත් අතර, එම යෝජනා කමිටුව මඟින් ප්‍රමුඛතා ගත කොට අදාළ වසමේ සේවය කරනු ලබන නිලධාරින්ගේ අත්සනින් යුතුව යෝජනා ලේඛන ලබාදී ඇත. ඒ අනුව ව්‍යාපෘති පිළිබඳ ශක්‍යතාවාර්තා ආර්ථික සංවර්ධන නිලධාරින් මඟින් ලබා ගෙන ක්‍රියාත්මක කරන ලදි.<br>එහිදී ග්‍රාම නිලධාරි වසමේ ප්‍රමුඛතාවය ලබාදි ඇති යෝජනා කෙරෙහි අවධානය යොමු කරන ලදි. | චක්‍රලේඛ ප්‍රකාරව ව්‍යාපෘති තෝරාගෙන ක්‍රියාත්මක කළයුතු වීම. |

## 2.2 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම්

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 262/2017 හා 2017 දෙසැම්බර් 29 දිනැති චක්‍රලේඛයේ 04 වගන්තිය ප්‍රකාරව විශ්‍රාම ගිය හෝ මියගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු කිසිදු ණය ශේෂයක් අත්තිකාරම් බී ගිණුමෙන් නොපෙන්වීමට ආයතන ප්‍රධානීන් වගබලා ගතයුතු වුවත්, පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක මියගිය නිලධාරීන් 12 දෙනෙකුගේ එකතුව රු.1,503,469 ක් වූ ණය ශේෂ පියවා ගැනීමට ප්‍රමාණවත් වැඩ පිළිවෙලක් සකස් කර නොතිබුණි. | මියගිය නිලධාරියෙකුගේ අයවිය යුතු රු.134345 ක ශේෂය මේ වනවිට අයකරගෙන ඇත. ඉතිරි ශේෂ අයකර ගැනීමට ඉදිරියේ දී කටයුතු කරමි. | මියගිය නිලධාරීන්ගේ ණය ශේෂ සම්බන්ධයෙන් රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 262/2017 ප්‍රකාරව කටයුතු කළයුතු වීම. |
| (ආ) | පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 03 ක වර්ෂ 1 – 5 ත් අතර, කාලයක සිට ස්ථාන මාරු වී ගිය නිලධාරීන් තිදෙනෙකුගෙන් අයකර ගතයුතු ණය ශේෂවල එකතු වටිනාකම රු.224,156 ක් විය. | එක් නිලධාරියෙකු ණය මුදල පියවා ඇත. අනෙක් නිලධාරීන් දෙදෙනාගේ ණය මුදල් පියවා ගැනීමට කටයුතු කරමි. | අදාළ හිඟ ණය මුදල් අයකර ගැනීමට කටයුතු කළයුතු වීම. |

**2.3** **තැන්පතු ගිණුම් ශේෂ**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| තැන්පත් කළ දින සිට වසර දෙක ඉක්ම වූ තැන්පතු ගිණුම් වර්ග 07 කට අදාළ එකතු වටිනාකම රු.50,679,629 ක් වූ පොදු තැත්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ඉදිරි වර්ෂය තුළ නිරවුල් කිරීමට කටයුතු කරනු ලබන බව. | තැන්පත් කළ දින සිට වසර දෙක ඉක්ම වූ තැන්පත් සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කළයුතු බව. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | මුදල් රෙගුලාසි 34 ප්‍රකාරව සමස්ථ පිරිවැය සඳහා ඇස්තමේන්තු පිළියෙල කිරීමෙන් තොරව ලැබෙන ප්‍රතිපාදන මුදලට ඇස්තමේන්තු පිළියෙල කර ක්‍රියාත්මක කිරීම නිසා දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 04 කට අදාළව රු.25,463,412 ක් වැයකර තිබූ ව්‍යාපෘති 55 ක් මහජනතාව වෙත ප්‍රතිලාභ ලැබීමකින් තොරව වසර කිහිපයක සිට නිශ්කාර්යව පවතින අතර, ඒ සඳහා වැය කළ රාජ්‍ය අරමුදල් නිශ්කාර්ය වියදමක් වී තිබුණි. | ඉදිරියේ දී ලැබෙන ප්‍රතිපාදන උපයෝජනය කර ව්‍යාපෘති නිම කිරීමට අදාළ දේශපාලන අධිකාරිය දැනුවත් කිරීම කර ඇත. | ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තු පිළියෙල කිරීමේ දී මුදල් රෙගුලාසි 34 ප්රකාරව මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කළයුතු වීම. |
| (ආ) | මහකුඹුක්කඩවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 2019 ගම්පෙරළිය කඩිනම් ග්‍රාමීය සංවර්ධන වැඩ සටහන යටතේ ක්‍රියාත්මක කර තිබූ ව්‍යාපෘති 20 කට අදාළව එකතුව රු.876,495 ක රැඳවුම් මුදල් අඩුකර ගෙවීම් කර තිබූ නමුත්, නඩත්තු කාලය තුළ හඳුනාගත් දෝෂ නිවැරදි කර නොතිබුණි. | ව්‍යාපෘති 13 ක රැඳවුම් කාලය තුළ ඇති වූ දෝෂ නිවරැදි කර ඇත. | ව්‍යාපෘතිවල රැඳවුම් කාලය තුළ දෝෂ නිවැරදි කළයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනයක් කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ස්ථාපිත කිරීම සඳහා 2019 වර්ෂයේ ගම්පෙරළිය වැඩසටහන යටතේ 2019 ඔක්තෝබර් 15 දින ප්‍රවේශ මාර්ගයට බොරළු දැමීමට රු.1,374,333 ක් ද, 2019 නොවැම්බර් 29 දින උක්ත ස්ථානය එළිපෙහෙලි කිරීම සඳහා රු.251,991 ක් ද, වැයකර තිබුණි. එනමුත් එකී කර්මාන්තය ඉදිකිරීම සඳහා නිශ්චිත සැලසුම් නොතිබිය දී ඒ සඳහා ගම්පෙරළිය වැඩ සටහනින් උක්ත මුදල් වියදම් කර තිබූ අතර, ඉන්පසු කිසිදු ඉදිරි කටයුත්තක් සිදුනොවීම නිසා අදාළ ප්‍රදේශය නැවත වල් බිහි වී තිබුණු බැවින්, වැයකර තිබූ සම්පූර්ණ මුදල ම නිශ්කාර්ය වියදම් වී තිබුණි. | යෝජිත විශ්වවිද්‍යාලය හා ගුරු අභ්‍යාස විද්‍යාලය ඉදිකිරීම් භූමියේ පිවිසුම් මාර්ග තැනීම හා ඉඩම වෙන්ව හඳුනා ගැනීමේ අවශ්‍යතාවය මත එවකට පැවති රජයේ සැලසුම් මත මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කළ අතර, ඉදිකිරීම් කටයුතු සම්බන්ධ වගකීම ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනය සතු බවත්, එය මාගේ රාජකාරි වපසරියෙන් බැහැර පවතින බව කාරුණිකව පෙන්වා දෙමි. | මේ සම්බන්ධව වගකිව යුතු පාර්ශව දැනුවත් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | දංකොටුව ජල සම්පාදන මණ්ඩලයට අයත් පීඩන තුලන ටැංකිය ස්ථාපිත කිරීමට නියමිතව ඇත්තේ දංකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ම/කහටවිල ග්‍රාම නිලධාරී වසම තුළය. මේ සඳහා එම ග්‍රාම නිලධාරී වසමෙහි ප්‍රාදේශීය සභාවට අයත් දෙල්ගහවත්ත නමැති ඉඩමෙන් හෙක් 0.2023 ක ප්‍රමාණයක් (රූඩ් 02) අත්පත් කර ගැනීමට අංක 1716/15 දරන 2011 ජුලි 26 දරන අති විශේෂ ගැසට් නිවේදනයට අනුව අත්පත් කර ගැනීමේ කටයුතු සිදුකර තිබුණි. අත්පත් කර ගැනීමේ මූලික කටයුතු හා වන්දි ගෙවීම් කටයුතු රු.773,220ක මුදලක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කර තිබූ අතර, වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව මඟින් ඉඩමේ භුක්තිය බාර නොදීම හේතුකරගෙන දංකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වසම් 28 ක් ද, නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් | වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය නිලධාරීන් එක්ව දංකොටුව පීඩන තුලන ඉදිකිරීමේ ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳ සාකච්ඡා කරන ලදී. ඒ අනුව දංකොටුව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අයත් පීඩන තුලන ටැංකිය ඉදිකිරීම සඳහා බ/කහටවිල වසම තුල රූඩ් 2 ක් වන දෙල්ගහවත්ත ඉඩමේ භුක්තිය භාර දීමට වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව සඳහා කැමැත්ත පළ කර ඇත. එසේම පීඩන තුලන ටැංකිය ඉදිකිරීම් කටයුතු සඳහා ජල සම්පාදන මණ්ඩලය සූදානමින් සිටී. ඒ අනුව දංකොටුව, නාත්තන්ඩිය, හා වෙන්නප්පුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසවල ග්‍රාම නිලධාරී වසම් 52 ක් මැදින් ජල | විශාල භූමි ප්‍රදේශයක් ආවරණය වන පරිදි ක්‍රියාත්මක කළ හැකි ව්‍යාපෘති කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමුඛතාවය ලබාදිය යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වසම් 07 ක් ද, වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වසම් 52 ක් ද වශයෙන් විශාල ප්‍රදේශයක් ආවරණය වන මෙම ව්‍යාපෘතියට ප්‍රමුඛස්ථානය ලබාදීමට බලධාරීන් කටයුතු කර නොතිබුණි. | පහසුකම් සැපයීමේ හැකියාව ඉදිරියේදී ඇති වන බව කාරුණිකව දන්වා සිටිමි. | |
| (ඉ) | වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දකුණ නාගමඩුව පුඹුදු පෙර පාසල් ගොඩනැඟිල්ල 2015 වර්ෂයේ දී රු.300,000ක ඇස්තමේන්තු වටිනාකමක් සහ 2018 වර්ෂයේ රු.500,000ක ඇස්තමේන්තුවක් මත ඉදිකර තිබුණි. 2021 පෙබරවාරි 23 දින විගණන පරීක්ෂාවේ දී ඉහත සඳහන් පෙර පාසල් ගොඩනැඟිල්ලේ බිම තැනින් තැන කැඩී වළවල් සෑදී තිබුණි. | මෙම ප්‍රදේශයේ භූමිය හුණුගල් සහිත වන හෙයින්, පොළොව ඉරිතැලීමේ තත්ත්වයක් පවතී. මෙම තත්ත්වය පාලනය කිරීමට අපහසුවේ. | ඉදිකිරීම් ව්‍යාපෘති ආරම්භ කිරීමේ දී භූමියේ ස්වභාවය හඳුනාගෙන ඊට ගැලපෙන පරිදි සැලසුම් සකස් කළයුතු වීම. |

## 3.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | මහවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මුහුදුකර ජනතාවගේ විවේක කාලය ගත කිරීම සඳහා ක්‍රියාශීලි දරු පරපුරක් ඇති කිරීමේ අරමුණින් බටහිර ඉරණවිල ළමා උද්‍යානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාවට නංවා තිබුණු අතර, එය බටහිර ඉරණවිල අනුරේඛා අංක PU/MHW/2016/122 නම් බිම් කොටසේ ඉදිකර තිබුණි. මෙය වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව අයත් වන අතර, විගණිත දින වනවිට මුහුදු ජලය ව්‍යාපෘතිය ඉදිකල ස්ථානයටම පැමිණ ඇති බව නිරීක්ෂණය විය. තවදුරටත් වෙරළ ඛාදනය වුවහොත් ව්‍යාපෘතිය වෙනුවෙන් වැයකල රු.927,000 ක මුදල නිශ්කාර්ය වියදමක් වන බවත්, වෙරළ ඛාදනය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බටහිර වෙරළ තීරය මුහුදු ඛාදනයට ලක් විය. විගණන විමසුමට ලක් ව ඇති ළමා උද්‍යානය ද බටහිර වෙරළ තීරයේ පිහිටා ඇති බැවින් ඉහත සඳහන් කළ ස්වාභාවික කාලගුණ ව්‍යසනයේ බලපෑම මෙම ළමා උද්‍යානය පිහිටි භූමිය සඳහා ද බලපාන ලදී. ඉදිකිරීම සඳහා භූමිය තෝරා ගැනීමේ දී මේ ආකාරයෙන් දැඩි මුහුදු ඛාදනයකට මෙම මුහුදු තීරය ලක් නොවී තිබූ බැවින්, භූමියේ ශක්‍යතාවය ඒ වන විට ප්‍රශස්ත මට්ටමක පැවතීම හේතුවෙන් අදාළ ව්‍යාපෘතිය තෝරා ගැනීමට කටයුතු කර ඇත. | මෙවැනි අඩුපාඩු නැවත ඇති නොවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතු අතර, විධිමත් අධ්‍යයනයක් කර වැයකල මුදල් වලින් ඉහළ ප්‍රතිලාභය ලබා ගැනීමට අවශ්‍ය තීරණයක් ගතයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | වැළැක්වීමට ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවත්, ව්‍යාපෘතිය සඳහා භූමිය තෝරා ගැනීමේ දෝෂයක් පවතින බවත් නිරීක්ෂණය විය. | | |
| (ආ) | ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කුමාරකට්ටුව ජල ව්‍යාපෘතිය සඳහා 2014 වාර්ෂික අයවැය යෝජනා යටතේ රු.3,884,248ක වැයකර තිබූ අතර, කුමාරකට්ටුව ප්‍රජාමූල සමිතිය මඟින් ද, රු.2,204,798ක් ද දරා තිබුණි. 2021 වර්ෂය වනවිටත්, එම ප්‍රදේශයේ ජනතාවට පානීය ජලය ලබාදීමට හැකිවී නොමැති බව නිරීක්ෂණය විය. | 2021 වර්ෂයේ ප්‍රතිපාදන උපයෝගී කරගෙන ජනතාවට ප්‍රතිලාභ කඩිනමින් ලබාදීම සඳහා කටයුතු කරමින් පවතී. | ඉතිරි අඩුපාඩු සම්පූර්ණ කර ප්‍රතිලාභ ලබාදීමට කටයුතු කළයුතු වීම. |
| (ඇ) | පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් “සපිරිගමක්” ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ රු.1,980,000 ක මුදලක් වියදම් කර ඉදිකර තිබුණු සෞඛ්‍ය මධ්‍යස්ථානය ඉදිකිරීම් කටයුතු නිමකර මාස 05 ක් ගතවී තිබුණ ද, සායන කටයුතු වෙනුවෙන් අදාළ නිලධාරීන් වෙත ලබාදී නොතිබුණි. එම ගොඩනැඟිල්ල නිශ්කාර්යව පවතින බව නිරීක්ෂණය විය. | ගොඩනැඟිල්ල නැවත සකස් කළ යුතු ස්ථාන පිළිසකර කර අදාළ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත එම කටයුතු පවත්වාගෙන යාම සඳහා භාර දීමට සූදානම් කර ඇත. | ගොඩනැඟිල්ල අදාළ කාර්යය සඳහා භාවිතා කර ජනතාවට ප්‍රතිලාභ ලබාදීමට කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රු.1,936,131ක් වැයකර 2014 වර්ෂයේ දී ඉදිකර තිබූ කරතිව් ප්‍රධාන බස් නැවතුම්පල හා ඊට අදාළ භූමිය 2021 වර්ෂය වනවිටත් භාවිතයට නොගෙන නිශ්කාර්යව පවතින බව නිරීක්ෂණය විය. තවද එම පරිශ්‍රය ගවයන් ආදී සතුන්ගේ නවාතැන් පලක් බවට තිබුණි. | මෙම බස් නැවතුම්පල ක්‍රියාත්මක කිරීමට වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව වෙත ලිඛිතව භාර දී ඇත. එය ප්‍රයෝජනවත් ලෙස භාවිතයට ගැනීමට අදාළ ආයතනය වෙත ලිඛිත දන්වා ඇත. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අරමුණු ඉටුකර ගැනීමට වගකිව යුතු නිලධාරීන් අවශ්‍ය පියවර ගතයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි දකුණු සායන මධ්‍යස්ථානය රු.4,646,356 ක වියදමින් 2014 වර්ෂයේ ඉදිකර තිබුණි. 2021 වර්ෂය වනවිටත්, භාවිතයෙන් තොරව නිශ්කාර්යව පැවතුණි. | මෙම ඉදිකිරීම ප්‍රාදේශීය සෞඛ්‍ය අධ්‍යක්ෂ කාර්යාල වෙත භාරදී ඇත. වෛද්‍යවරුන්ගේ හා කාර්ය මණ්ඩල පුරප්පාඩු වීම නිසා මෙම සායන මධ්‍යස්ථානය පවත්වාගෙන යාමේ අපහසුතාවයක් ඇති බව දන්වා ඇත. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අරමුණු ඉටුකර ගැනීමට වගකිව යුතු නිලධාරීන් අවශ්‍ය පියවරගත යුතු වීම. |
| (ඊ) | වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සැලසුම් අංශයේ අංක වනා/සං/ විමධ්‍ය.පොදු.3 දරන හා අංක වනා/සං/විමධ්‍ය/පොදු 18 දරන ලිපිගොනු මඟින් ගඟේවාඩිය ගම්මානයේ අත්පන්දු ක්‍රීඩාංගනයක් සැකසීමට අදාළ තොරතුරු වාර්තා වී තිබුණද විගණනයෙන් එම ස්ථානය භෞතිකව පරීක්ෂා කිරීමේ දී එම ප්‍රදේශයේ තිබූ අත්පන්දු ක්‍රීඩාංගනයට අදාල උපකරණ නිරීක්ෂණය නොවුණි. | අත්පන්දු ක්‍රිඩාංගනය උපකරණ ගලවා ඉවත් කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පොලිසියට පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත. | වත්කම් ආරක්ෂා කර ගැනීමට කටයුතු කළයුතු වීම. |
| (උ) | වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ එක් මාර්ගයක බොරළු දැමූ ආසන්න කාලයක වර්ෂාව ඇතිවීම හා ඒ සමඟ රථවාහන ධාවනය වීමෙන් මාර්ගයේ වළවල් සහ කාණු ස්වභාවයක් බවට පත්වී තිබුණු බැවින්, රඳවුම් මුදල් නිදහස් කිරීමට පෙර එය සකස් කළයුතුව පැවති බව නිරීක්ෂණය විය. බොරළු දැමූ මාර්ග රෝල් භාවිතයෙන් තලා තිබුණ ද මාර්ගයේ දෙපස මාර්ග මායිමට ආසන්න මිලිමීටර් 300 ක් පමණ ප්‍රමාණවත් පරිදි තැලීමට ලක් වී නොමැති බව නිරීක්ෂණය විය. ඒ සඳහා හේතු වී තිබුණේ සභාව සතුව හෝ කුඩා ප්‍රජාමූල සංවිධාන සතුව හෝ ග්‍රාමීයව ඒ සඳහා භාවිතාකරන යන්ත්‍රයක් (Rammer/Vager) නොමැති වීමය. | පිළිගනිමි. බොරළු අතුරන මාර්ගයන්හි දෙපස කොටස් තැලීම සඳහා තලනයක් **(RAMMER)** භාවිතා කිරීමටත් ඉදිරියේ දී සම්පත් සහිත සුදුසු සමිති හෝ උපකරණ කුලියට ලබාගෙන වැඩ විෂයයන් ක්‍රියාත්මක කිරීමට එකඟ වන සමිති සඳහා වැඩ විෂයයන් පිරිනැමීමටත් කටයුතු සිදු කරමි. | මාර්ග උරහිස් සඳහා බොරළු දැමූ පසු සුදුසු තැලීමේ උපකරණයක් භාවිතයෙන් වතුර ඉස තැලීම කළයුතු බව. |

## 3.3 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහකුඹුක්කඩවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් 2014 වර්ෂයේ දී ආරම්භ කරන ලද ජනසෙත ප්‍රජාමූල ජල ව්‍යාපෘතියේ ජල ටැංකිය, පොම්පාගාරය, ළිඳ හා ජලනල එළීම වැනි කටයුතු සිදුකිරීම් සඳහා රු.10,232,645 ක් වියදම් වී තිබුණ ද, 2021 වර්ෂය වන විටත් ඉතිරි ජලනල හා උපාංගවල අඩුපාඩුව මත ජල ව්‍යාපෘතියේ ප්‍රතිලාභ අදාළ ජනතාවට ලැබී නොතිබුණි. | පවතින අඩුපාඩු සම්පූර්ණ කරන ලෙස ප්‍රජා මූල සමිතිය දැනුවත් කර ඇත. අදාළ උපාංග මේ වනවිට සැපයීමට කටයුතු කර ඇත. | නිශ්චිතව සම්පූර්ණ කිරීමේ කාලයකට අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ප්‍රතිලාභ ජනතාවට ලබාදීමට කටයුතු කළයුතු වීම. |

## 3.4 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2017 වර්ෂයේ දී ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ විශේෂ වැඩසටහන යටතේ රු.1,500,000 ක ප්‍රතිපාදන මත ඉදිකර තිබූ පවර්ලූම් රෙදි විවීමේ මධ්‍යස්ථානය ගොඩනැගිල්ල අත්තිවාරම දක්වා පමණක් ඉදිකර තිබූ අතර, 2021 වර්ෂය දක්වා ම එහි ඉතිරි වැඩ සම්පූර්ණ කර නොතිබුණි. | ඉතිරි වැඩ සඳහා ප්‍රතිපාදන වෙන් වී නොමැත. මෙම ඉදිකිරීම ආණමඩුව වි.සේ.ස.සමිතිය වෙත පැවරීමට කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී. | මුළු පිරිවැය ඇස්තමේන්තුවක් මත ඉදිරි වර්ෂවල ප්‍රතිපාදන ලබාදීමේ එකඟතාවය ලබාගෙන ව්‍යාපෘති ක්‍රියාත්මක කළයුතු බව. |
| (ආ) ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් වර්ෂ 2015 සිට 2019 දක්වා කාලය තුළ රු.7,725,000 ක මුදලක් වියදම් කර ආරම්භ කර තිබුණු ව්‍යාපෘති 18ක් නිම නොකර අත්හැර දමා තිබුණු අතර, එම ව්‍යාපෘති නිමකිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ගේ අවධානය යොමු වී නොතිබුණි. | අදියර වශයෙන් ඉදිකිරීමේ අපේක්ෂාව මත ලැබෙන ප්‍රතිපාදන මුදලට ඇස්තමේන්තු සකස් කරනු ලැබීය. නමුත් නැවත මුදල් වෙන් නොකිරීම නිසා මෙම ව්‍යාපෘති අඩක් නිමවූ ව්‍යාපෘති බවට පත්ව ඇත. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීමට අදාළ හේතු සොයා බැලිය යුතුයි. ව්‍යාපෘති සම්පූර්ණකර ප්‍රතිලාභ ලබාගත යුතු වීම. |

## 3.5 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මෝටර් රථයක ඇන්ජින් අංක හා චැසි අංක ලියාපදිංචි ලේඛන සමඟ නොසැසඳෙන බැවින්, දුම් පරීක්ෂණය හා වාර්තා ආදායම් බලපත්‍ර ලබා ගැනීමෙන් තොරව මාර්ගයේ ධාවනය වන බව නිරීක්ෂණය වේ. මේ සම්බන්ධයෙන් විගණන විමසුම් ගණනාවකින් අවධානය යොමු කර තිබුණ ද, එය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. තවද, මෙම කාරණය මෝටර් රථ වාහන පනතට අනුකූල නොවන තත්ත්වයක් බවද, නිරීක්ෂණය විය. | විගණන නිරීක්ෂණ සමග එකඟ වෙමින් එය නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවති. | හේතු සොයා බැලිය යුතුය. මෝටර් රථ වාහන දෙපාර්තමේන්තුවේ උපදෙස් මත අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කළයුතු වීම. |
| (ආ) | උතුරු සිරිගම්පල හා දකුණු කොලින්ජාඩිය ඉඩම්වල පිහිටි නිල සෙවන කාර්යාල ඉදිකර තිබුණ ද, අදාළ ඉඩම් වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් වෙත පවරාගෙන නොතිබුණි. | උ/සිරිගම්පල හා ද/ කොළින්ජාඩිය රජයේ ඉඩම්වල ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ ඉදිකර තිබූ නිල සෙවන ගොඩනැගිලි වේ. මෙම ඉඩම් රජය සතු වුවද, ප්‍රාදේශීය ලේකම් වෙත භුක්තිය භාරදී ඇති ඉඩම් නොවන බව දන්වා සිටිමි. එහෙත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුල ඇති සියළුම රජයේ ඉඩම්, ඉඩම් අංශය මඟින් නඩත්තු කරනු ලබන රජයේ ඉඩම් ලේඛනයේ සටහන් කර ඇති බව දන්වා සිටිමි. | පවරා ගැනීමට කටයුතු කළයුතු වීම. |

## 3.6 කළමනාකරණ දුර්වලතා

----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ඉදිකිරීම් කර්මාන්තවල නඩත්තු කාලය අවසන් වීමට පෙර එම කර්මාන්ත පරීක්ෂා කර බලා අඩුපාඩු පවතීනම් කඩිනමින් නිමකරවාගෙන නඩත්තු කාලය අවසන් වූ පසු රඳවුම් මුදල් ගෙවීමට කටයුතු කළයුතු වුවද කල්පිටිය, නවගත්තේගම, පුත්තලම, ආරච්චිකට්ටුව හා ආණමඩුව යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් නිම කර තිබූ ඉදිකිරීම් කර්මාන්ත 485 කට අදාළ රු.12,782,957 ක රඳවුම් මුදල් නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | විගණන විමසුම්වලට ලක්වී ඇති ව්‍යාපෘති හැර ඉතිරි ඉදිකිරීම් පරීක්ෂාකර බලා රඳවුම් මුදල් නිදහස් කිරීමට කටයුතු සිදුකරමින් පවතී. | රඳවුම් කාලය අවසන් වූ පසු භෞතික පරීක්ෂා කර අඩුපාඩු පවතීනම් කාර්යක්ෂමව එම අඩුපාඩු සම්පූර්ණ කරවාගෙන රඳවුම් මුදල් නිදහස් කළයුතු වීම. |
| (ආ) "සපිරිගමක්" ප්‍රජාපාදක ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ 2020 වර්ෂයේ දී රු.990,184 ක මුදලක් වියදම්කර කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉලන්තඩිය ධීවර තොටුපොලට යන කස කැලේ වැල්ල පාර තාර දමා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ ඇස්තමේන්තුව අනුව මාර්ගයේ දිග ප්‍රමාණය මීටර් 155 ක් සහ පළල මීටර් 2.74 ක් ලෙස දක්වා තිබුණි. එහෙත් ඇස්තමේන්තු කළ ප්‍රමාණයට වඩා මාර්ගයේ පළල තැනින් තැන මීටර් 2.5 ත් මීටර් 2.6 ත් අතර, අගයක් ලෙස පැවතුණි. මාර්ගය සඳහා නිසි ප්‍රමිතියට අනුව තාර නොදමා තිබීම හේතුවෙන් මාර්ගයේ ගල් පැදී තිබීම සහ මාර්ගය දෙපස පුරවා තිබුණු පස් සේදීයාමට සිදුව තිබුණු බැවින්, මාර්ගය දෙපස ගල් ගැලවී යාමේ අවධානමකට ලක් ව තිබූ අයුරු නිරීක්ෂණය විය. | විගණනයේ දී හඳුනාගත් අඩුපාඩු කොන්ත්‍රාත්කරු මඟින් ඉටුකරවා ගෙන රඳවුම් මුදල් නිදහස් කිරීමට කටයුතු කරමි. | භෞතික මිනුම් ප්‍රමාණ අනුව ගෙවීම් කළයුතු අතර, ඇස්තමේන්තු පරිදි ඉදිකිරීම් කිරීමට නිසි අධීක්ෂණයක් තිබිය යුතුය. ඉදිකිරීම් අඩුපාඩු හඳුනා ගෙන කොන්ත්‍රාත්කරුගෙන් ඉටුකරවා ගැනීමට කටයුතු කළයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතිය යටතේ 2014 වසරේ දී දංකොටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලබාදී තිබූ උපපත්‍රිකා තොගයක් එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීම තුළ විනාශ වී තිබුණි. 2014 වසරේ දී විද්‍යුත් ජාතික හැඳුනුම්පත් කාර්යාලය සකස් කිරීම සඳහා ලබා දී තිබූ A/C Plant එක වර්ථමානයේ දී අක්‍රීය වී තිබූ අතර, එය ඉන්වෙන්ට්‍රියට ඇතුළත් කර නොතිබුණි. | 2016 වර්ෂයේ දන්කොටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පිහිටි ගොඩනැඟිල්ල කඩා ඉවත් කර නව ගොඩනැඟිල්ලක් ඉදි කිරීම හේතුවෙන්, පරණ ගොඩනැගිල්ලේ තැන්පත් කර තිබූ විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතියට අදාළ ලේඛන ප්‍රමාණය කාර්යාල පරිශ්‍රයේ වූ නිල නිවාසයෙහි ගබඩා කෙරුණි. වසරක් පුරා මෙසේ පැවති අතර එහිදී, මීයන් හා කාවන් වැනි සතුන් කා දැමීම නිසා මෙම ලේඛන විනාශ වී යාමේ තත්වයක් මතු වූ අතර, එම නිසා එම ලේඛන කඩිනමින් ආරක්ෂා කර ගැනීම සඳහා ගබඩා කිරීමට සුදුසු ස්ථානයක සුරක්ෂිතව ගබඩා කිරීමට කටයුතු කර ඇත.<br>විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතියට අදාළව ස්ථාපිත කර ඇති දෙපාර්තමේන්තු ශාඛා කාර්යාලයෙහි සවි කර තිබූ වායු සමීකරණ යන්ත්‍රය 2014 වර්ෂයේ සිට මේ දක්වා අක්‍රීයව පවතින අතර, ඒ පිළිබඳව කිහිප වරක් ලිඛිතව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇත. මෙම වායු සමීකරණ යන්ත්‍රය මෙතෙක් ඉන්වෙන්ට්‍රි ගත කර නොතිබූ අතර, | නොසැළකිල්ලක් හෝ ප්‍රමාදයක් වී ඇත් ද යන්න සොයාබලා ක්‍රියාකල යුතු වීම. |

| | | |
|---|---|---|
| | 2020 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේ උපදෙස් පරිදි මේ වන විට වායු සමීකරණ යන්ත්‍රය ඉන්වෙන්ට්‍රි ගත කිරීමට කටයුතු සූදානම් කර ඇත. | |

**4.** **තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පුත්තලම සහ කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් සිය විෂයපථයට අදාළව තිරසාර සංවර්ධන අරමුණු සහ අරමුණු සම්බන්ධයෙන් වන ඉලක්ක, පාදක දත්ත සහ ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක හා තිරසාර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනයේ කාර්යභාර්ය හා සම්බන්ධ උනන්දුවක් දක්වන පාර්ශවයන් යනාදිය හඳුනාගෙන නොතිබුණි. | තිරසාර සංවර්ධන අරමුණු හඳුනා ගැනීම් පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීමට කටයුතු යොදා ඇත. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා වන මඟ පෙන්වීම් අනුව සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළයුතු වීම. |

**5.** **යහපාලනය**

**5.1** **මහජනයා වෙත සේවා ඉටු කිරිම**

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහකුඹුක්කඩවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මේ දක්වා ගෙවීම් නොලද වකුගඩු දීමනා, වැඩිහිටි දීමනා හා ආබාධිත දීමනා සඳහා ලියාපදිංචි වූ පුද්ගලයින් 394 ක පොරොත්තු ලේඛනයක් නඩත්තු කර තිබුණ ද එම ගෙවීම් සඳහා අනුමැතිය ලබාගෙන ආධාර මුදල් ගෙවීමේ කටයුතු සම්පූර්ණ කර නොතිබුණි. | පොරොත්තු ලේඛන ගතව සිටින අඩු ආදායම්ලාභී ආධාර ඉල්ලුම්කරුවන් පිළිබඳ තොරතුරු හා අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය ඒ ඒ අදාළ අමාත්‍යාංශ වෙත මාසික වාර්තා මඟින් දැනුම් දෙනු ලැබේ. ලබා දෙන ප්‍රතිපාදන සීමාව තුල ලබා දිය හැකි උපරිම ප්‍රතිලාභින් සංඛ්‍යාව සඳහා ආධාර ලබා දී ඇති බව කාරුණිකව සඳහන් කරමි. | ගෙවීම් කිරීමට අවශ්‍ය කටයුතු සම්පූර්ණ කළයුතු වීම. |

**6.** **මානව සම්පත් කළමනාකරණය**

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අනුමත කාර්ය මණ්ඩලය තුළ තනතුරු 13 කට අදාළව සේවක පුරප්පාඩු සංඛ්‍යාව 25 ක් විය.<br><br>(ආ) පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අනුමත කාර්ය මණ්ඩලය තුළ තනතුරු 18 කට අදාළව සේවක පුරප්පාඩු 390 ක් පවතින බව නිරීක්ෂණය විය. | දැනට පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා අදාළ අංශ වෙත තොරතුරු දැනුම් දී ඇත. | අවශ්‍යතා විශ්ලේෂණයක් කර අත්‍යවශ්‍ය නම් පමණක් බඳවා ගැනීම් කළයුතු අතර, පුරප්පාඩු බහුල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ප්‍රමුඛතාවය අනුව හඳුනා ගෙන අනුයුක්ත කිරීම් කළයුතු වීම. |